# නාට්‍ය විචාර මූලධර්මානුගත මුද්‍රා රාක්ෂසය

අඹලියද්දේ නන්ද හිමි

'Mudrarakshasaya' written by 'vishakhadatta' has enlightened literature on traditional drama. This great drama which has a relevance to politics has taken a different dimension from all the other dramas of such caliber. Mudrarakshasaya clearly depicts the stratagem of the protagonist chanakya, the drama portrays the conflict between crafty chanakya who supported king chandraguptha and rakshasa and nandas who were the ministers of nanda wanshaya mudrarakshasaya which was composed according to the principles of drama represents the synthesis of the appreciation of drama and political perspectivec.

© අඹලියද්දේ නන්ද හිමි

සංස්. පී. ඒ. අමිල මදුසංක, ජයමල් ද සිල්වා, දිල්ෂාන් මනෝජ් රාජපක්ෂ, චන්දන රුවන් කුමාර, එච්. ඒ. ගිහාන් මධුසංඛ, නන්දුලා පෙරේරා
'ප්‍රභා' ශාස්ත්‍රීය සංග්‍රහය, සිවු වැනි කලාපය - 2014/2015
මානවශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය

සංස්කෘත දෘශ්‍ය කාව්‍ය සාහිත්‍යය, සුවිශාල වූවකි. අශ්වඝෝෂ, භාෂ, කාලිදාස ආදි පඬිවරුන්ගේ නිර්මාණ මඟින් තත් සාහිත්‍යය සුපෝෂණයට අපමණ මෙහෙයක් සිදු විය. ආගමික, සමාජයීය හා දේශපාලනික වශයෙන් වැදගත් වන සේ නිර්මාණ ඉදිරි පත් කිරීමට ඔවුහු සමත්කම් පෑ හ. ඒ අතර විශාඛදත්ත නම් පඬිවරයා විසින් විරචිත මුද්‍රාරාක්‍ෂසය, දේශපාලන කුමන්ත්‍රණ විෂය කොටගත්තකි.

ඓතිහාසික පාත්‍රයන් යොදා ගනිමින් විශාඛදත්තයන් විසින් රචනා කරන ලද මුද්‍රාරාක්‍ෂස නාටකය සංස්කෘත දෘශ්‍යකාව්‍යයන් අතර විශේෂ ස්ථානයක් ගන්නකි. මෙකී නාට්‍යය පිළිබඳ හැම විශේෂතාවක් ම රඳා පවතින්නේ එහි දක්වෙන ඓතිහාසික හා දේශපාලනික ස්වරූපය මත ය. මුද්‍රාරාක්‍ෂසයේ නායිකාවන් නැති වා පමණක් නොව ස්ත්‍රී චරිත ද උපයුක්ත වී නොමැත. එහි අප්‍රධාන ස්වරූපයෙන් එක් තැනක දී පමණක් ස්ත්‍රී චරිතයක් උපයුක්ත වේ. එනම් හත් වන අංකයේ දී චන්දනදාස උල තබන්නට ගෙන යන විට ඔහු පසු පස හඬමින් යන ඔහුගේ බිරිය යි. එය ද ශෘංගාරය ඉස්මතු කිරීමේ අදහසින් යොදන ලද චරිතයක් නො ව චන්දනදාස මුහුණ පා ඇති අවස්ථාව පිළිබඳ පාඨකයා කෙරේ ඇති වන භාවයන් දියුණු කරලීම සඳහා යොදන ලද්දකි. එසේ ම දෘශ්‍ය කාව්‍යාගත සාම්ප්‍රදායික චරිතයක් වූ විදූෂකට මුද්‍රාරාක්‍ෂසයේ දී තැනක් හිමි වී නොමැත. මේ අනුව මෙකී නාට්‍යයෙන් දේශපලන ස්වරූපයක් ඉස්මතු වන බැවින් ස්ත්‍රි චරිතය හා විදූෂක චරිතය එතරම් වැදගත් නැතැ යි සිතා ඒ කෙරෙහි අවධානය අඩුවෙන් යොමු වූවා දැ යි සිතීම යෝග්‍ය වේ.

අනෙකුත් නාට්‍යවල දී මෙන් ප්‍රේමයට තැනක් නො ලැබීම මෙහි ඇති විශේෂතාවකි. ප්‍රේමවස්ථා මුළුමනින් ම අතහැර දැමූ විශාඛදත්ත ස්වකීය නාට්‍යයේ ඉදිරි පත් කරන්නේ නොයෙකුත් කූටෝපායයන් යොදා සිය බලය තහවුරු කරගැනීම සඳහා තරග කරන එමෙන් ම ක්‍රියාශීලී චරිතයන්ගෙන් යුත් දේශපාලන තෝතැන්නකි.

සුපුරුදු පරිදි මුද්‍රාරාක්‍ෂස නම් වූ නාට්‍යය ද ආරම්භ වන්නේ නාන්දි නම් වූ ආශිර්වාදයෙනි. ඉන් අනතුරු ව ප්‍රස්තාවනාවේ දී

වේදිකාවට පිවිසෙන්නේ සූත්‍රධාර හා නටී අතර වන චන්ද්‍රග්‍රහණයක සිද්ධියකි. එය ඇසී නේපථ්‍යයෙහි සිට 'කියාපන් කවුද? මා ජීවත් ව සිටිද්දී චන්ද්‍රගුප්ත පරද්දන්න සූදානම් වන්නේ' යනුවෙන් මැත දොඩමින් මුදන ලද කෙස් වැටිය අතගාමින් මහත් කෝපයෙන් චානක්‍ය වේදිකාවට පිවිසෙයි. එසේ චානක්‍යගේ පැමිණීමෙනි, මුද්‍රාව ලැබීම නම් වූ ප්‍රථමාංකය ආරම්භ වන්නේ. චානක්‍ය හට ඔහුගේ ඔත්තුකරුවකුගේ මාර්ගයෙන් නන්ද පාර්ශික රාක්ෂස අමාත්‍යයාගේ මුද්‍රාව ලැබෙයි. චානක්‍යය, රාක්ෂස අමාත්‍යයා ලියන ව්‍යාජයෙන් ලියූ ලිපියක් රාක්ෂසගේ පෞද්ගලික ලේකම් වූ ශකටදාස ලවා ලියවා ගනියි. හත් වන අංකයේ දක්නට ඇති රාක්ෂසගේ ඉෂ්ඨාර්ථ සිද්ධියට බෙහෙවින් ඉවහල් වූයේ මෙකී ලිපිය හා ඉහතින් කී මුද්‍රාව ය.

අමාත්‍යයාගේ ප්‍රාණප්‍රිය මිත්‍රයෙකු වූ චන්දනදාස නම් වෙළෙන්දා ඔහු වෙත රඳවා සිටි රාක්ෂසගේ භාර්යාව පවරා නො දීමේ වරදට චානක්‍ය ඔහුගේ වස්තුව පැහැර ගෙන අඹුදරුවන් සහිත ව හිර ගෙයි දමයි. චානක්‍යගේ ම උවදෙස් පරිදි සිද්ධාර්ථක නැමැත්තා ශකටදාස වධ්‍යස්ථානයෙන් පැහැරගෙන යයි. චානක්‍ය, සිද්ධාර්ථක කාර්ය හොඳින් ආරම්භ කර ඇතැ යි සිතමින් ම ඔහු අල්වා ගෙන ඒමට අණ දෙයි.

දෙ වැනි අංකයේ දී රාක්ෂස යෙදූ පිළියම් අනාවරණය වෙයි. චන්ද්‍රගුප්ත මැරීම සඳහා ඔහු විසින් සකස් කරන ලද උපක්‍රම සඵල නො වී ඒ වෙනුවට පර්වතක මරුමුවට පත් වූ බව ද ඉන් පසු ව මලය කේතුගේ මාමා කෙනෙකු වූ වෛරෝචන මරන ලද බව ද සංදේශයක් ගෙන ආ කෙනකු රාක්ෂසට දැන්වූ පසු ඔහු බලවත් සේ සිත් තැවුලට පත් විය. රාක්ෂසගේ සෙසු චර පුරුෂයන් වූ ප්‍රමෝදක හා අභය දන්ත ද චන්ද්‍ර ගුප්තට හානියක් කිරීමට අසමත් ව තමන් ම හානියට පැමිණිය හ. අවසානයේ ශකටදාස එහි පැමිණි චන්දනදාස ළඟ තිබී සොයාගත් රාක්ෂසගේ මුද්‍රාව නැවත ඔහුට භාර දුණි. චන්ද්‍රගුප්ත විසින් චානක්‍යයට අපහාස කරන ලද බව දැනගත් ඔහු විකිණීම සඳහා පෙන්වන ලද අගනා ආභරණ තුනක් මිල දී ගන්නා ලෙස ශකටදාසට අණ කළේ ය.

චන්ද්‍රගුප්තගේ මාලය තුන් වැනි අංකයෙන් නිරූපණය වෙයි. චන්ද්‍රගුප්ත නියම කළ වසන්තෝත්සවය චානක්‍ය විසින්

තහනම් කරනු ලැබීම නිසා චන්ද්‍රගුප්ත හා චාණක්‍ය අතර බොරු දබරයක් හට ගනී. රජ තෙම මෙතැන් පටන් චානක්‍ය නැති ව චන්ද්‍රගුප්ත රට පාලනය කරන බව වැසියනට දන්වන ලෙස නියම කරයි.

සිවු වැනි අංකයේ දී චන්ද්‍රගුප්ත නියම කළ බොරු දබරය පිළිබඳ පුවත සත්‍ය එකක් ලෙසින් රාක්ෂසට දැනගන්නට ලැබෙයි. මේ චානක්‍ය - චන්ද්‍රගුප්ත භේදය ගැන ඔහු කථා කරමින් සිටින අවස්ථාවෙහි දී හිසරදයකින් පෙලෙන රාක්ෂස බැලීමට පැමිණෙන මලය කේතු කුමාරයා, රාක්ෂසට නො දැනෙන සේ ඒ කථාව අසා සිටියි. එහි දී රාක්ෂස චානක්‍යගේ තැනට පැමිණීමට අදහස් කරන්නේ ද යන සැකයක් මලය කේතුට ඇති වෙයි. චානක්‍යගේ අනුශාසකත්වයෙන් තොර චන්ද්‍රගුප්ත දුර්වලයෙකැ යි ද එය ඔහු නෙරපා මලය කේතු රාජ්‍යයේ අභිෂේක කිරීම සඳහා ඇති හොඳ ම අවස්ථාවකැ යි ද සිතන රාක්ෂස මලය කේතු ද ඒ සඳහා පොලඹවා ගෙන ඊට සුදුසු වේලාවක් ද නැකැත්කරුවන් ලවා බලවයි. මෙයින් සිවු වැනි අංකය නිමාවට පත් වෙයි.

මලය කේතුගේ යුද කටයුතු පිළියෙල වන ආකාරය පස් වැනි අංකයේ ආරම්භය දක්වයි. ජීව සිද්ධි හා භගුරායණ අතර හටගත් දෙ බසකට සවන් දුන් මලය කේතුට තම පියා විෂ දී මරණ ලද්දේ යැ යි සැක පහළ විය. බලපත්‍රයන් නොමැති ව යුද නිවසට ඇතුළු වීමට උත්සහ කළ සිද්ධාර්ථක, රාක්ෂසගේ මුද්‍රාව සහිත ව ලියන ලද ලිපිය ගැන සඳහන් කළේ ය. ඒ අනුව රාක්ෂසගෙන් චන්ද්‍රගුප්ත වෙතට යැවීමට අදහස් කරන ලද රහස් ලිපියක් ද ඔහු අත යවන පණිවිඩයක අඩංගු වූ චාණක්‍ය නෙරපාදැමීමේ ඉල්ලීම ද මිතුරු රජවරුන් සතුරු පාර්ශ්වයට බැඳී ද්‍රෝහි ව කටයුතු කිරීමට නියම කළ කරුණ ද යන මේ සියල්ල මලය කේතුට දැනගන්නට ලැබිණි.

මලය කේතු මෙකී සාක්ෂ්‍ය රාක්ෂස ඉදිරියේ තබා ඔහුගෙන් ප්‍රශ්න කළේ ය. මුද්‍රා සහිත ලිපිය ව්‍යාජ එකක් වූ නමුදු ඔහුගේ ම මුද්‍රාව එහි තිබුණු නිසා එය ප්‍රතික්ෂේප කිරීමට නො හැකි විය. අවසානයෙහි මෙය විශ්වාස කළ මලය කේතු, මිතුරු රජවරුන් වළලා දමන ලෙස නියෝග කළ අතර එහි දී රාක්ෂස පමණක් ඉතිරි කළේ ය.

සවන අංකයේ දී ඉදිරි පත් වන්නේ චානක්‍යගේ තවත් කූට උපායකි. එහි දර්ශනය පාලු උයනකි. රාක්ෂස මේ උයනට පිවිසෙයි. ඔහු නො දුටු පරිද්දෙන් එක් මිනිසකු ගෙල වැල ලාගැනීමට සැරසෙයි. එය දුටු රාක්ෂස ඔහු වෙත අවුත් කරුණු විමසයි. තම ප්‍රිය මිත්‍ර ජිෂ්ණුදාස, ඔහුගේ මිත්‍රයකු වූ චන්දනදාස උල තැබීමේ පුවත අසන්නට පෙර ගිනි තබාගෙන මරණයට පත් වීම සඳහා නුවරින් පිට ව ගිය බවත්, ජිෂ්ණුදාසගේ මරණය පිළිබඳ පුවත සැල වීමට පෙර තමා ද ගෙල වැල ලාගැනුමට යන බවත් කියයි. එබස් අසා ජිෂ්ණුදාස බේරාගැනීම සඳහා ඒ මිනිසා පිටත් කොට තමන් චන්දන දාස ද බේරාගන්නා බව කියා හේ පිටත් ව යයි.

සත් වැනි අංකයේ දී චන්දනදාස ගලවාගැනීම සඳහා රාක්ෂස වධ්‍යස්ථානයට එයි. එහි දී ඔහු ව චානක්‍යගේ පුරුෂයන් විසින් අත්අඩංගුවට ගන්නා ලදු ව චානක්‍ය වෙත ඉදිරි පත් කරනු ලබයි. තම මිතුරා ගලවාගැනීම සඳහා ඔහුට චන්ද්‍රගුප්තගේ අමාත්‍ය තනතුර භාරගැනීමට සිදු වෙයි. මේ අතර මලය කේතු ආදිහු ජීවග්‍රහයෙන් ගෙන මාංචු දමා ගෙන එනු පෙනෙයි. ඔවුනට සුදුස්සක් කරන ලෙස චානක්‍ය තෙමේ රාක්ෂස ඇමතියාට පවරයි. රාක්ෂස තමා ටික කලක් හෝ මලය කේතු සමඟ සිටි බැවින් ඔහුට ජීව දානය දිය යුතු බව පවසයි. එහි දී චන්ද්‍රගුප්ත චානක්‍යගේ මුහුණ දෙස බලයි. චානක්‍ය රාක්ෂසගේ මුල් ම ඉල්ලීමට ඉඩ දිය යුතු බව පවසා මලය කේතු නිදහස් කොට පිය උරුම රාජ්‍ය ඔහුට යළි පවරා දෙයි. රාක්ෂසගේ මිත්‍ර චන්දනදාස මුළු පොළවෙහි ම නායක සිටු තනතුරට පත් කරයි.

භාරතීය දෘශ්‍යකාව්‍ය සම්ප්‍රදායය අනුව මෙසේ සියල්ල සතුටින් අවසන් වෙයි. මෙසේ ඓතිහාසික වූ පාත්‍රයන් උපයෝගී කොටගෙන ඓතිහාසික සිද්ධීන් නාට්‍ය ස්වරූපයෙන් ඉදිරි පත් කරන දේශපාලන නාට්‍යයක් වශයෙන් පමණක් නොව කලා කෘතියක් වශයෙන් ද මුද්‍රා රාක්ෂසය පිරුණු අගයකින් යුක්ත ය. ශෘංගාරය ස්වල්ප මාත්‍රයක් වශයෙන් හෝ ඇතුළත් නො වීම ද සංස්කෘත දෘශ්‍ය කාව්‍යාවලියේ ක්‍රමයෙන් විකට චරිතයක් බවට පත් විදූෂක චරිතයක් නො වීම ද මේ නාට්‍යයේ රස හීන වීමට කිසිසේත් ම හේතුවක් වී නොමැති බව පෙනෙයි. වෙනත් කිසි දු දෘශ්‍ය කාව්‍යයක දක්නට නොමැති තරම්

සිද්ධීන්ගේ ඒකීය භාවයක් සේ ම මුදුන් පමුණුවාගත යුතු අරමුණ කෙරෙහි නැමුණු බවක් මෙහි දක්නට තිබේ. මුද්‍රාරාක්ෂසයේ උපයුක්ත වී ඇති ලොකු කුඩා හැම පාත්‍රයෙකුගේ ම ක්‍රියාවන් එකී අරමුණට අනුකූල වන පරිදි ම සිදු වෙයි. ඒ නිසා වස්තු විකාශනය පිළිබඳ ව කුඩා පාත්‍රයකුට වුව මහත් වගකීමක් පැවැරී ඇත. මුද්‍රාරාක්ෂසයේ සිද්ධි ඈණහිටීමෙන් තොර ව ඉදිරියට ගමන් කරයි. සිදුවන හැම සිද්ධියක් ම ප්‍රධාන අරමුණ කෙරෙහි යොමු ව තිබීම එයට හේතුව යි. එනිසා ම නාට්‍යයේ අවසානය දක්වා පාඨකයාගේ අවධානය රැක ගැනීමට විශාඛදත්තයෝ සමත් වෙති.

ඓතිහාසික තොරතුරු ඉදිරි පත් කරන මේ නාට්‍යය හුදෙක් ඓතිහාසික තොරතුරු හෙළි කරන නාට්‍යයක් ලෙස නො සැලැකිය යුතු යි. මුද්‍රාරාක්ෂසයට සංස්කෘත නාට්‍ය සාහිත්‍යයේ උසස් තැනක් හිමි වෙයි. එය එසේ සලකනු ලබන්නේ එහි අනඟි වස්තු සංදර්භය නිසා ය. වැදැගත් නාට්‍ය අංග වූ සන්ධි අංග - ප්‍රකෘති - අවස්ථා වශයෙන් සලකා බලතොත් මේ මුද්‍රාරාක්ෂසය, නාට්‍ය රීතීයට දැඩි අනුකූලතාවක් දක්වයි. නාට්‍ය වස්තුවේ විකාශය සකස් වීමේ දී එහි ක්‍රමාභිවර්ධනයට පටහැනි වන සිදු වීම් සහිත උපවස්තු එයට එක් වේ. මෙයින් පාඨකයන්ගේ සිත් තාවකාලික ව ව්‍යාකූල විය හැකි නමුදු නාට්‍ය වස්තුවේ නිර්වහනයට එයින් බාධාවක් නො වේ.

චරිතයන් අතර ප්‍රතිවිරෝධයක් ඇති වන සේ ඔවුන් නිරූපණය කිරීම මේ නාට්‍යයේ තවත් වැදැගත් ලක්ෂණයකි. චානක්‍ය හා රාක්ෂස අතර විරෝධය මලය කේතු අතර විරෝධය ද මේ අතුරින් මතු කොට දැක්වෙන වැදැගත් ලක්ෂණ වේ. විශාඛදත්තගේ චරිතය මඟින් මනා චරිත නිරූපණය විශද වෙයි. දෙ දෙනා ම තමන්ගේ වංශයේ බලය තහවුරු කරගැනීම සඳහා ඉතාමත් උද්‍යෝගයෙන් කටයුතු කරන ආකාරයක් පෙනි යයි. චානක්‍ය කපටි, විචාරාක්ෂම, ප්‍රත්‍යුපක්‍රම සහිත ඉතා ම දක්ෂ කෙනකු වූ නමුදු රාක්ෂස දයාන්විත ත්‍යාගශීලී දැමුණු කෙනෙකි. චානක්‍යගේ පරුෂ ගතියට විරුද්ධ ව රාක්ෂසගේ මොළොක් බව ගැන සිතන විට මේ දෙ දෙනා අනඟි ප්‍රතිවිරුද්ධ චරිත ලෙස ගිණිය හැකි ය. මලය කේතු අනුන් ගැන සැක කරන සිතා මතා තීරණයක් නො ගන්නා චපල කුමාරයකු ලෙස දැක්වේ.

චන්දනදාස හා බාගුරායන ඒ අතර වැදැගත් අප්‍රධාන චරිත දෙකකි. ඔවුහු තම අභිමතාර්ථ සාධනයට විශාල අධිෂ්ඨානයකින් ක්‍රියා කරති. මෙහි දී විශේෂයෙන් ම නාට්‍ය රචකයාගේ රචනා විලාසය කෙරෙහි අවධානය යොමු කිරීමේ දී ඔහුගේ භාෂාව ප්‍රාණවත් බව වැටහෙයි. එසේ ම අර්ථවත් ද වෙයි. ඔහු පද්‍ය රචනයේ ද ප්‍රවීණයෙකි. ගද්‍ය රචනයට ද එපරිදි ම වෙයි. දිග වෘත්ත වූ ශාර්දූලවික්‍රීඩිත හා ස්‍රග්ධරා වෘත්ත ඔහු නාට්‍යයේ වඩාත් භාවිත කොට ඇත්තේ එමඟින් අදහස් පුළුල් ව ද ශක්තිමත් ව ද පැවැසීමට අවකාශ ඇති හෙයිනි. දිග සමාස මෙන් ම ව්‍යාකූල අලංකාර ප්‍රයෝග ද දක්නට නොමැත. ගද්‍ය පද්‍ය ශෛලීන් නාට්‍යයට උචිත ලෙස සංයෝග කරගැනීම ඔහුගේ පරමාර්ථය යි.

සංස්කෘත නාට්‍ය සාහිත්‍යයේ ක්‍රමාභිවෘද්ධිය වීමංසනය කරන්නකුට ක්‍රි. ව. නව වැනි සියවසේ දී රචිත සේ සැලැකෙන මුද්‍රාරාක්‍ෂසය අංශ කිහිපයක් යටතේ වැදැගත් වේ. පළමු ව එහි වස්තු විෂයය වූ කලි දේශපාලන කුමන්ත්‍රණයකි. නන්දරාජ වංශය හා ගුප්ත රාජවංශය භාරතීය දේශපාලන බලය අල්ලාගැනීම මෙහි පසුබිම විග්‍රහ කරයි. නන්ද වංශයේ තනතුරු දැරූ රාක්‍ෂස නම් අමාත්‍යයන් නන්ද වංශයේ විනාශකාරයා වූ චන්ද්‍රගුප්ත රජුගේ උපදේශක, චාණක්‍ය අමාත්‍යයාත් අතර ඇති වූ සටන හා බලකාමී සටන මෙහි ලා නාට්‍ය ස්වරූපයෙන් විග්‍රහ වේ.

දෙවනු ව නාට්‍ය ප්‍රයෝග ගැන සලකන විට ද මේ රචනය වැදැගත් වේ. මෙය සංස්කෘත නාට්‍ය රචනා විලාසය ගැන ආදර්ශ සැපැයිය හැකි කෘතියකි. දස වැනි සිය වසේ ලියැවුණු දශරූපයේ නිදසුන් ලෙස මේ නාට්‍යයෙන් උද්ධරණිත පාඨ දැක්වීම එහි ප්‍රයෝග කෞශල්‍යයට නිදසුනකි. ප්‍රස්තාවනාවෙහි සූත්‍රධාර හා නිළිය අතර චන්ද්‍රග්‍රහණයක් ගැන කියැවීම සමඟ ම චාණක්‍ය රංග මණ්ඩලයට ප්‍රවිශ්ට වීමේ සිට විග්‍රහ වන මේ කතා පුවත අංක හතකින් සමන්විත වෙයි. අතීතාවර්ජනය කරන සමාලෝචන හා රහස් ලිපි, වෙස්වළා ගැනීම්, රහස් දූත ගමන් ආදියෙන් මේ නාට්‍යය පිරී පවතී. මාළිගවල උද්ගත ගැටලු මෙන් ම දේශපාලකයින් ආශ්‍රය කරන්නවුනට මතු වන ප්‍රශ්න ද මේ නාට්‍යයේ දී මනාව විස්තර වෙයි. අර්ථශාස්ත්‍රය, දණ්ඩ නීතිය පිළිබඳ පාරප්‍රාප්ත ඥානයක් මෙහි විද්‍යමාන ය.

විශාඛදත්තගේ නාට්‍යයේ තුන් වෙනුවට දක්නට ලැබෙන්නේ විශේෂතා ය. තමා සූර නාට්‍ය රචකයකු බව විශාඛදත්ත දැන සිටි බව මුද්‍රාරාක්‍ෂසයේ ම සතර වැනි අංකයෙන් හා හ වැනි අංකයෙන් විස්තර වෙයි. නාට්‍ය රචකයා මෙන් ම දේශපාලකයා ද කරන්නේ එක ම කාර්යයකි. එනම් අන්‍යයන් මුළා කොට ප්‍රතිඵල නෙළා ගැනීමෙන් සිය අභිමතාර්ථය මුදුන් පමුණුවාගැනීම යි. මෙය හුදෙක් මනෝන්මාද ප්‍රකාශයක් නො වෙයි. නාට්‍ය සන්දර්භයේ වැදැගත් වන සන්ධි, අංග, ප්‍රකෘති, අවස්ථා ආදි ලක්‍ෂණ ස්ථිර ව ම පිළිපදිමින් මේ කෘතිය රචනා කිරීම නිසා සංස්කෘත නාට්‍ය සාහිත්‍යයේ මෙයට විශිෂ්ට ස්ථානයක් හිමි වේ. චරිත අතර විරෝධතා මතුවන පරිදි චරිත නිරූපණය කිරීම ද විශාඛදත්තගේ දක්‍ෂතාවකි. එපමණක් ද නො ව නාට්‍යයකට උචිත වන ප්‍රාණවත් ගද්‍ය සංවාද භාවිතය අතින් ද මුද්‍රාරාක්‍ෂසයට වැදැගත් තැනක් හිමි වේ.

මේ අනුව මුද්‍රාරාක්‍ෂස නම් නාට්‍යය වනාහි නාට්‍ය ලක්‍ෂණයන්ගෙන් පරිපූර්ණ රස පිරුණු, අරුත් පිරුණු නාට්‍යයක් ලෙස සම්භාවිත බව පැහැදිලි ය. එහි දී අප ඉහතින් සඳහන් කළ පරිදි සුවිශේෂ චරිත අවස්ථා තරමක් ගිලිහී ගිය ද එහි ඇති වටිනාකමට මෙන් ම විකාශයට ද එය බාධාවක් නො වීම මේ නාට්‍යය පාඨක හදට සමීපස්ථ වීමට තුඩු දෙයි. විශේෂයෙන් ම චරිත, අවස්ථා, සිද්ධි, භාෂාව, නාට්‍යෝචිත පරිදි මනා ව සුසංයෝග කොට ඉදිරි පත් කිරීමට ගත් කතු ඥානාන්විත වීම අගය කටයුතු වේ. ඒ අනුව සංස්කෘත විචාර මූලධර්ම උල්ලංඝනය නො කොට තම නිර්මාණය සිදු කිරීමට කතුවරයා සමත් වී තිබෙන බව පැහැදිලි වෙයි.

## මූලාශ්‍රය නාමාවලිය

තිලකසිරි ජයදේව (වර්ෂය) 2000, **සංස්කෘත නාට්‍ය සාහිත්‍ය**, කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදයෝ.

වීරතුංග, එස්. **දසරූපය** (ධනංජය රචිත), කොළඹ, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

මොරටුවගම, එච්. එම්. **නෘත්‍ය මඤ්ජුසා**. කොළඹ. ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

ජයසුමන, එච්. ජී. 1963, **නාට්‍ය විචාරය හා මූලධර්ම**. කොළඹ. රත්න පොත් ප්‍රකාශකයෝ.

**විතර්ක**, 1985, සංස්කෘතික හා ශාස්ත්‍රීය ප්‍රකාශනය, කොළඹ, ප්‍රදීප ප්‍රකාශකයෝ.

1998, ශාස්ත්‍රීය සංග්‍රහය, ශ්‍රී ලංකා භාෂෝපකාර සමාගම.

1999, ශාස්ත්‍රීය සංග්‍රහය, ශ්‍රී ලංකා භාෂෝපකාර සමාගම.

මාරසිංහ, වෝල්ටන්. **භරතමුනි ප්‍රණීත නාට්‍ය ශාස්ත්‍රය**. කොළඹ. ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.